# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
# தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
# MINISTRY OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

"මිලෝදා" (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල), පළමු මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. / 'மிலோதா', 1ஆம் மாடி,பிரிஸ்டல் வீதி,கொழும்பு 01./ "Miloda"(Old Times Building), 1st Floor, Bristol Street, Colombo 01


මගේ අංකය / vdJ ,y / My No } MNPEA/PLN/E1/CCEM

ඔබේ අංකය / ckJ ,y / Your No }

දිනය / jpfjp / Date } 2016.09.08

චක්‍රලේඛ අංක : MNPEA 03/2016 (ප්‍රතිශෝධිත)

ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

**සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ගොවි සංවිධාන වෙත සෘජුව පිරිනැමීම**

පහත සඳහන් නිර්ණායකයන්ට යටත්ව සුදුසුකම් සහිත ගොවි සංවිධානවලට වටිනාකම රුපියල් මිලියන 5 දක්වා වූ සුළු වාරිමාර්ග පද්ධති සහ ඒවා සම්බන්ධිත කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණයට අදාල වැඩ සෘජුවම ප්‍රදානය කළ හැකිවේ.

(1) යෝජිත කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සලකා බලන අවස්ථාව වන විට අවම වශයෙන් වසර දෙකකට කලින් සමිතියක් වශයෙන් ගොවිජන කොමසාරිස් ජනරාල්වරයා යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) ප්‍රදානය සඳහා යෝජිත කොන්ත්‍රාත්තුවද ඇතුළුව සමිතිය විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට (03) නොවැඩි විය යුතුය.

(3) දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල ඉතිරි වැඩ කොටසේ වටිනාකම හා යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකමේ එකතුව අනුව එම සියළු වැඩ කොටස් ඉටු කිරීමට අවශ්‍ය පිරිස්, උපකරණ හා මූල්‍ය ධාරිතාව සමිතිය සතු බව සනාථ විය යුතුය. අවශ්‍ය උපකරණ සමිතිය සතු නොවන අවස්ථාවලදී ඒවා කුලී පදනමින් සපුරාගත හැකි බව තහවුරු කළ යුතුවේ.

(4) ගොවි සංවිධාන එකකට වැඩි සංඛ්‍යාවක් යෝජිත කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ඉදිරිපත් වන අවස්ථා වලදී බල ප්‍රදේශය තුල වූ ගොවි සංවිධාන සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

නියෝජ්‍ය/සහකාර ගොවිජන කොමසාරිස් සභාපතිත්වය දරණ, සිවිල් ඉංජිනේරු වරයෙකුගෙන් හා ගණකාධිකාරීවරයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් විසින් ඉහත යෝග්‍යතා පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව අදාල ගොවි සංවිධානයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ යුතුවේ.




දුරකථන / தொலைபேசி / Telephone } + 94 – 11- 4461500

ෆැක්ස් / தொலைநகல் / Fax } + 94 – 11- 2339732, + 94 – 11- 2473643

විද්‍යුත් තැපැල / மின்னஞ்சல / E-mail } info@mppea.gov.lk

Website } www.mppea.gov.lk

(5) කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඇස්තමේන්තු නියෝජ්‍ය/සහකාර ගොවිජන සේවා කොමසාරිස් විසින් අනුමත කළ යුතු අතර එම ඇස්තමේන්තුව දිස්ත්‍රික් මිල කමිටුව විසින් කලින් කල අනුමත කරනු ලබන රේටයන් මත පදනම් විය යුතුය.

(6) බිලපත් ගෙවීම් කිරීමේදී ඊට අදාල වැඩ කොටස් නියමාකාරයෙන් සිදුකර ඇති බවට දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලයේ ඉංජිනේරුවරයා/තාක්ෂණික නිලධාරි පෞද්ගලිකව සෑහීකමකට පත්වීමෙන් අනතුරුව ගෙවීම් සිදුකල යුතුය.

(7) පවරන ලද වැඩ උප කොන්ත්‍රාත් නොදෙන බවට නියෝජ්‍ය/සහකාර ගොවිජන සේවා කොමසාරිස් විසින් වගබලා ගත යුතුය.

(8) දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමේදී මේ ආකාරයට එක් එක් බල ප්‍රදේශයට අදාලව පවරන ලද කොන්ත්‍රාත් හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම කිරීම සඳහා න්‍යාය පත්‍රයේ අයිතමයක් ලෙස ඇතුලත් කල යුතුය.

මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත්කරන ලදී.

**එම්.අයි.එම්. රෆීක්**
ලේකම්
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

පිටපත් : ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
භාණ්ඩාගාර ලේකම්
ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු
විගණකාධිපති
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්
සියළුම නියෝජ්‍ය/සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරුන්